**ශීර්ෂය 259 - මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

----------------------------------------------------------

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

------------------------------------------------

(අ) ප්‍රාදේශීය පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කරමින් දිස්ත්‍රික් පරිපාලන කටයුතු මෙහෙයවීම.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් මනා වූ මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යාම.

(ඇ) ප්‍රාදේශීය මට්ටමින් සිදු කෙරෙන සියලුම ක්‍රමසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒවායෙහි ප්‍රගති පාලන කටයුතු සිදු කිරීම.

(ඈ) දිස්ත්‍රික් පරිපාලන කටයුතුවලට සම්බන්ධ සියලුම නිලධාරීන්ගේ මානව සම්පත් සංවර්ධන කටයුතු සිදු කිරීම.

(ඉ) දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනයට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒවායෙහි ප්‍රගති පාලන කටයුතු සිදු කිරීම.

(ඊ) දිස්ත්‍රික්කයේ පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම වෙනුවෙන් වූ ප්‍රාග්ධන ආයෝජනයන්ට අදාල සියලුම ඉදිකිරීම් කටයුතු සැලැසුම් කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම.

(උ) දිස්ත්‍රික් කෘෂිකර්ම කටයුතු හා පාරිසරික කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒ ආශ්‍රිත ගැටළු විසඳීමට කටයුතු කිරීම.

(ඌ) දිස්ත්‍රික්කයේ අධ්‍යාත්මික සංවර්ධනය හා ජාතීන් අතර සුහදත්වය ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු මෙහෙයවීම.

(එ) ඉඩම් ගැටළුවලට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

(ඒ) ගිනි අවි බලපත්‍ර නිකුත් කිරීම, පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු.

(ඔ) දිස්ත්‍රික් තොරතුරු සම්පාදනය.

(ඕ) දිස්ත්‍රික් ව්‍යවසායකත්ව සංවර්ධනයට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

--------------------------------------------------------------------------

(අ) පල්ලේපොළ
(ආ) ගලේවෙල
(ඇ) දඹුල්ල
(ඈ) අඹන්ගඟ කෝරළේ
(ඉ) රත්තොට
(ඊ) මාතලේ
(උ) නාඋල
(ඌ) උකුවෙල
(එ) යටවත්ත
(ඒ) විල්ගමුව
(ඔ ) ලග්ගල-පල්ලේගම

## 1.3 විගණන විෂය පථය.

-----------------------

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී . ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.

------------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණය.

-----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **විසර්ජන ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.487,075,000 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.482,822,573 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.4,252,427 ක් හෙවත් සියයට 0.9 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 436,825,000 | 435,057,769 | 1,767,231 | 0.4 |
| මූලධන | 50,250,000 | 47,764,804 | 2,485,196 | 4.9 |
| එකතුව | 487,075,000 | 482,822,573 | 4,252,427 | 0.9 |

**(ii) අයවැය විචලනය**

පුනරාවර්තන වැය විෂයයන් 06 කට හා මූලධන වැය විෂයයන් 03 කට අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 07 සිට සියයට 28 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(iii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 24 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු.1,947,816,335 ක්වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.914,851,351ක් හා රු.839,715,869 ක් වශයෙන් එකතුව රු.1,754,567,220 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින්

රු.173,903,581 ක් හා රු. 19,345,534 ක් වශයෙන් එකතුව රු. 193,249,115 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරියන් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 16 ත් සියයට 02 ත් අතර ප්‍රමාණයක් ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී තිබූ රු.730,212,240 ක ප්‍රතිපාදනවලින් රු.586,164,568 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර, රු.144,047,672 ක් හෙවත් සියයට 20 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

- ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2013 මාර්තු 28 දිනැති අංක 1/2013 දරන චක්‍රලේඛය අනුව දිළිඳුකම පිටු දැකීමේ අරමුණට ප්‍රමුඛතාවය දෙමින් අදාළ ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් තෝරාගත යුතු වුවද, එම අරමුණට බැහැරව යමින් මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.95,000 ක් වැයකර මාතලේ ක්‍රිස්තුදේව ජාතික පාසලේ ආදි ශිෂ්‍ය සංගමයට හොකී පිති 10 ක් සහ හොකී බෝල 02 ක් ලබාදී තිබුණි.

- ලොකු ඇණු ගබඩා 35 ක් ඉදිකිරීමට රු.3,500,000 ක වියදමින් නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තෝරාගත් ගොවීන් 35 දෙනෙකු අතුරින්, ගොවීන් 6 දෙනෙකු ගබඩා ඉදිකර නොතිබුණි. කෙසේ වුවද ඒ වෙනුවට වෙනත් ගොවීන් 6 දෙනෙකු හඳුනාගෙන එම ප්‍රතිපාදන ලබාදීමට පියවර ගෙන නොතිබුණි.

- රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2012 වර්ෂයේදී ඇති වූ ආපදා තත්ත්වය මත හඳුනාගත් පූර්ණ හානි 67 කට හා අර්ධ හානි 177 ක් වෙනුවෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් රු.17,915,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා ප්‍රතිපාදන ගෙන්වා ගැනීම නිසි අධ්‍යයනයකින් තොරව සිදු කිරීම නිසා අවශ්‍යතාවය ඉක්මවා ප්‍රතිපාදන සළසා ගැනීම හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.7,307,600 ක ප්‍රතිපාදන ඌන උපයෝජිතව පැවතුණි.

- “කිරි වීදුරුව” වැඩසටහන යටතේ ලියාපදිංචි පෙර පාසල් 13 ක් වෙනුවෙන් රු.414,930 ක ප්‍රතිපාදන අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය

ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු නමුත්, පෙර පාසල් 07 කට පමණක් මෙම වැඩසටහන සීමාවීම හේතුවෙන් රු.145,470 ක ප්‍රතිපාදන ඌන උපයෝජිතව පැවැතුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 25901 | 25,000,000 | 24,944,419 | 24,000,000 | 27,203,041 | 150,000,000 | 110,623,971 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.671,905 ක් විය.

(ii) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/ 2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ හා 2013 ජනවාරි 31 දිනැති අංක 157(1) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවී මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිලධාරීන් තිදෙනෙකුට නියමිත සීමාව ඉක්මවා එකතුව රු. 282,034 ක ආපදා ණය ලබා දී තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම්**

2013 දෙසැම්බර් 31 දිනට මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 6003/0000/00/0035/0000/000 දරන පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.120,233,213 ක් විය. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක කාලයක් ඉක්මවන ලද එකතුව රු.452,904 ක්වූ තැන්පතු ශේෂ 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශ දෙකකින්, දෙපාර්තමේන්තුවකින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.460,000 ක මුදල් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

**1.6 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් සඳහා වෙන්කර ඇති රජයේ නිවාසය 2013 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 ක කාලයක් ප්‍රයෝජනයට නොගෙන පැවතුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

--------------------------

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ එකතුව රු.2,099,315 ක් වූ බැරකම් පැවතුණි. එම ශේෂ සියල්ල වර්ෂයකට වඩා අඩු කාලයකට අයත් ඒවා විය.

## 1.7 අනුකූල නොවීම්

---------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104 (4) | - | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක වාහන වලට සිදු වී තිබුණු අනතුරු 03ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) **විශ්‍රාම වැටුප් චක්‍රලේඛ** | | |
| 2010 දෙසැම්බර් 16 දිනැති අංක 13/2010 දරන චක්‍රලේඛයේ ඇමුණුම් 01 හි 04 ඡේදය | 4,500 | 2013 මාර්තු 30 දිනට වයස අවුරුදු 26 සම්පූර්ණ වූ අනත් දරුවකුට, ඒ ගැන නොසළකා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 පෙබරවාරි මාසය වන විටත් අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි. |

## 1.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

-------------------------------------------

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම.**

යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2012 ඔක්තෝබර් 15 දින රු.993,630 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ යටවත්ත - උතුරු මාතලේ නළ ලිඳක් හා ජල ටැංකියක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර 2012 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.569,480 ක් වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සඳහා 2013 වර්ෂයේදී රු.430,520 ක ප්‍රතිපාදන ලැබී තිබුණු නමුත්, මීනිරන් සහිත වැලි නළ ළිදට එකතුවීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය නොකර ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි.

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘති | 2013 වර්ෂය සඳහා ලද ප්‍රතිපාදනය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | | | | රු. | |
| (i) | දඹුල්ල ගංවතුර ආපදා අවම කිරිමේ ව්‍යාපෘතිය. | 20,200,000 | 2013.11.04 | 2013.12.31 | 2014.01.30 දින වන විටත් නිමකර නොතිබුණි. | 4,639,034 | ඇස්තමේන්තු සකස් කිරීමේ හා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය. |
| (ii) | පුංචි රත්තොට නායයාම් අවම කිරීමේ ව්‍යාපෘතිය. | 10,000,000 | 2013.07.31 | 2013.12.31 | 2014.01.30 දින වන විටත් නිමකර නොතිබුණි. | 2,327,489 | මූලික ඇස්තමේන්තුව සංශෝධනය සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ඉල්ලීම් කිරීමට සිදුවීම. |

**1.9 කාර්යසාධනය**

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ නව පරිපාලන සංකීර්ණය ඉදිකිරීමේ දෙවන අදියර සඳහා 2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් රු.9,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු නමුත්, අදාළ ව්‍යාපෘති වාර්තාව ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අනුමතවීම ප්‍රමාදවීම හේතුවෙන් 2013 වර්ෂයේදී එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොතිබුණි.

(ආ) **සැලැසුම් කිරීම**

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම.**

සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත විස්තර දැක්වෙන අවස්ථාවලදී ක්‍රියාකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු ඇස්තමේන්තුගත පිරිවැය රු.10,350,000 ක් වූ ඉදිකිරීම් හා අළුත්වැඩියා කිරීම් සම්බන්ධ ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ පිරිවැය රු.3,095,155 ක් වූ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම්වලට සම්බන්ධ ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කර තිබුණි.

**1.10 පාඩු හා හානි**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති නිපුණතා ප්‍රවර්ධන ඒකකයට අයත් රු. 87,994 ක් වටිනා පරිගණක යන්ත්‍රයක් 2013 අප්‍රේල් මාසයේදී අස්ථානගත වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ සම්බන්ධයෙන් අදාළ ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

**1.11 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර වර්ෂ 1 සිට වර්ෂ 38 දක්වා කාලයක් ගතවී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) පාර්ලිමේන්තු ගරු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩලයේ සේවය සඳහා ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරිනියක් පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයට නිදහස් කර තිබුණ නමුත් 2013 අගෝස්තු හා සැප්තැම්බර් යන මාස දෙක සඳහා අදාළ නිලධාරිනියට ගෙවා තිබුණු රු.48,955 ක වැටුප් හා දීමනා 2014 අගෝස්තු 31 දින දක්වා ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

**1.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 හි සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වෙන පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 45 | 08 | - |
| (ii) තෘතියික මට්ටම | 35 | 20 | 15 | - |
| (iii) ද්විතියික මට්ටම | 907 | 654 | 253 | - |
| (iv) ප්‍රාථමික මට්ටම | 116 | 109 | 07 | - |
| (v) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 04 | - | 04 |
| එකතුව | 1,111 | 832 | 283 | 04 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට පැවැති පුරප්පාඩුවලින් පුරප්පාඩු 83ක් පිරවීම 2014 ඔක්තෝබර් වන විටත් අපොහොසත් වී තිබුණි.

(ii) බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට 2014 ඔක්තෝබර් වන විටත් කටයුතු කර නොතිබුණි.